


## ලාංකීය පොප් සංගීතයේ සක්විති හෙවත් රන් නෙලුම් සම්මානයෙන් ජාතිය පිදු

# බයිලා චක්‍රවර්ති එම්.එස් ප්‍රනාන්දු

උදුවප් මාසය මෙන්ම බක් මාසය සම සමසේ වැදගත් වූ යුගයක් විය. ද සොයිසා රෝහලෙන් පිටත් වන මයිනර් ටැක්සිය කොළොන්නාව තෙල් ගබඩාව සහ පුංචි බෝධිය පසුකර ඉදිරියට කන්ද නගී. ප්‍රසව වේදනාවෙන් මත්වූ අම්මා බුද්දක දෙස බලා ආදරයේ උණුසම පෙරලා දුන්නේ පිටුපස ආසනයේ සිටය. සෝමේ, තිලකේ, ඉදුරුවෙන් කොළඹට පැමිණි ටැක්සි රථාචාර්ය වරු විය. එම්.එස්. ටැක්සි රියදුරකුගේ සිත් අභ්‍යන්තරයට පිවිසෙන්නේ කැරකෙන ටැක්සි මීටරයටත් හොරාය. මානුෂීයව කරුණාබරිතව ඒ දෙස බලයි.

**මම ටැක්සිකාරයා මම ඇරල යන්න**
**හරිම සූරයා**
**කවුද මිත්‍රයා මම නොදන්න කොළඹ**
**හාදයා**

බුද්දක පැටියා සුළුඩිය දහරක් නොදන්නාසේ අම්මාගේ ඔඩොක්කුවේ මුදා හැරියේ අනාගතේ මරුසිරාවරු ටුක්ටුක් එලවනු ඇතැයි නොදැනය. බයිලා සංගීතයෙහි උත්කෘෂ්ට වැදගත්කම රැඳී ඇත්තේ වචන, රිද්මය, උචිත තනු මත නම් ඊට විවාදයෙන් තොර පිළිතුර සපයන්නේ බයිලා චක්‍රවර්ති ලෙස ශ්‍රී ලංකා සංගීතයෙහි කිරුළු පැළඳි එම්.එස්. ප්‍රනාන්දුය.

**සිලි සිලියේ නව සුවදක් විහිදී එනවා**
**වන බඹරාමල සොයලා පියාබා යනවා**

ශ්‍රී ලංකාවේ බයිලාව කෙතරම් ජනප්‍රිය වී ප්‍රචලිත වී ද යත් දකුණේ පන්සලක විහාර චිත්‍රයක පවා කටු සටහන් ලෙස හමුවීමෙන් සනාථ වේ. මංජුශ්‍රී විසින් අහංගම කතළුව පූර්වාරාම විහාරයේ ප්‍රතිචිත්‍ර ගත කළ විහාර සිතුවමක යුරෝපීය හා දේශීය ලක්ෂණ සහිත හිස්වැසුම්, රංග වස්ත්‍ර හා සංගීත භාණ්ඩ කටු සටහන් තිබී හමු වී ඇත.

බුද්දකගේ ගෙදරට හැරෙන්න තිබුනේ ඉස්කෝල මායිම සහ රෝසාගේ ගෙදර මායිම් අගින්ය. ඒ විමලාරම පාරය. අපි හිටපු මහ ගෙදර තිබුණේ ගල්කිස්ස සුමනාරාමය පිටුපසය. කාමරේට සුමනාරාම පන්සලේ බෝධින් වහන්සේයි, බුදු පිළිමෙයි පෙනෙනවා. වර්තමානයේ අපට ඇසෙන බොහෝ දුක් අඳෝනා ගී මෙන් නොව ගීතවත් බසකින් අපූරු අත්දැකීමක් පිළිබඳ එම්.එස්. අප අමතයි. චිත්‍රපට ගීතයෙහි දී තිරයේ දිස්වන රූපාවලිය අර්ථ ගන්වන හඬින්, ප්‍රේක්ෂකයන්ට, ශ්‍රාවකයන්ට ළං වන්නට සමත් වෙයි.

**ගෙදර හිටිය රෝස කැකුල රෝසා**
**ඔමරි බොමරි දාපු මුකුළු රෝසා**
**අපිත් එක්ක හරි යාළුයි රෝසා  රෝසා**
**නැතුව ගේ පාළුයි රෝසා..**



ළසඳා චිත්‍රපටයේ එච්.ආර්. ජෝතිපාල හා එම්.එස්. ගයන ආචාර්ය කේමදාස සංගීතවත් කළ ගෙදර හිටිය රෝස කැකුල රෝසා ගීතය, අපූර්ව චිත්‍රපට ගීයක් වන්නේ එම්.එස්. ජෝති ගැයුමින්, කේමදාස මාස්ටර්ගේ සංගීතය හා ගී තනුවෙන්, ඩොමී ජයවර්ධන, ඩී.ආර්.නානායක්කර පියදාස ගුනසේකර ආදීන්ගේ විශිෂ්ට රංගන හා මිශ්‍රවීමෙන් නොවන්නේද? ධර්මසිරි අන්කල් සිටියේ සාලවත්ත පාරේය. බුද්දක කොලූකමට ගමේ කරක් ගහද්දී උන්නැහේ මාලිගාවත්තට ගියා. එම්.එස්.ට ආවේනික රංගන විලාශය ඔහුගේ ප්‍රසාංගික කලාව තුල අසමසම විය.රාත්‍රියේ වේදිකාවේ වේගරිද්මයෙන් ප්‍රසාංගික වන ඔහු සැමදා උදේට නැගිටින කොටම බුදු ගුණ කියාගෙන නැගිටින බව දන්නේ පවුලේ ය පමණි. උදේම නානවා, ඒක එයාගේ පුරුද්දක්.

**පෙම් ලොව නින්දෙ දි  මා දුටු සුන්දර**
**සිහිනේ**
**දැන් එලි වී ඇත  හඳ වගෙ ලස්සන**
**මුහුණේ**
**හද පොපියයි සිත නලියයි  බැලූ බැලූ**
**අත එළියයි**

වසන්ත සමයේදී කොවුලන්ගේ ගී නාදය කාටත් මිහිරක් ගෙන එන්නේය. සොබා දම් මාතාව ද ඊට නොදෙවෙනිව තම රූප සොබාවෙන් හැඩ වන්නීය. වසන්ත සමය එසේ වුණත් වසන්ත සමයක් නැතත් වසරේ ඕනෑම විටෙක ගීත ගයන්නට උපන් හපනෙක් විය. හැටේ වත්තෙන් පිටවූ කීර්ති අයියාගේ මෝටර්රිය කඩාගෙන බිදගෙන ඇදුනේ කොළඹ හදිසි අනතුරු අංශය කරාය. අපි සතුටෙන් ඉද්දී වේගයෙන් බයිලා කිවූ සනී හෙවත් වී නම්වූ රස කොවුලා ඊටත් වේගයෙන් හුස්ම පිට කල වග රිය අසුනේ සිටි පැස්කුවෙල් අයියාද දැනන් හිටියේම නැත.

**මම බොහොම බය වුනා මගෙ පන**
**එපා වුනා**
**රෑ දොළහට හොල්මනකට මාව අසු**
**වුනා**

වීරේ, ඕකත් ලිවුවේ අපේ එකා, යයි කිවුවේ ලේක්හවුසියේ කර්තෘ මණ්ඩලයේ එවකට සිටි හැරී උබයසේන උන්නැහේය. අපේ තාත්තාගේ අතිජාත මිත්‍ර සමාගමේ හැරී අන්කල්ට කැබිනට් පට්ටමක් හිමි විය. හැරී අන්කල්ගේ ඥාති සහෝදරයා වී අංකල් විය. බයිලා කලාව දේශීය හුරුවකට රටාවකට ලාංකීය රසිකයා අතර මුද්‍රා ගත කිරීමේ පුරෝගාමී මෙහෙවරක් කල යුග පුරුෂයෙක් විය. භාෂා පහකින් ගීත ගැයීමේ සුවිශේෂී හැකියාවද සරල පද මාලාවට මුසු වූ බයිලා සංගීතය ජනප්‍රිය අන්තයේ ඉහලින් ස්ථානගත විය.

**දිළි දිළි දිළිසෙන එළියක්**
**එළියෙන් දෙන**
**කළඑළියක්**
**කළුගල් අතරට**
**මැණිකක් පහල වෙලා**
**ඇත්තේ**
**කළුගල් අතරට**
**මැණිකක් පහල වෙලා**
**ඇත්තේ**

සුසිල් එම්.එස්.ගේ පවුලේ වැඩිමහල්ම දරුවා විය. බුද්දක අපේ පවුලේ එකම දරුවා විය. මම ඉපදුන දවසේ අපේ තාත්තා ගොඩාක් සතුටු වුණා කියලා අම්මා කියලා තියෙනවා. බුද්දක උණුසුම සොයා සොයා උක්කු බොද්දි කලබලේ කාමරේට කඩා ආවේ හැරීගේ මස්සිනා බවයි අපේ අම්මා කියන්නේ. හැරීගේ මස්සිනා එම්.එස්. බව මගේ කන් පෙති වලට සහ නළල් තලේ ඇතුලූ මායිමට තේරුම් ගියේ සුනාමි ආවටත් පස්සේ.

**පුතෙක් උපන්නා**
**කිරිකැටි පුතෙක් උපන්නා**
**පුතෙක් උපන්නා**
**සෙලින්ට පුතෙක් උපන්නා..**

එම්.එස් තම ගීතාවලියෙහි දී හමුවන සොයායන ඇසුරු කරන චරිත අතර අපගේ ජනජීවිතයට සෘජුවම සම්බන්ධවන, චරිත, ඔහු තම නිසර්ග ගායනාවෙන් රසිකයන් හමුවේ නිරූපණය කරනු ලබන ඇතැම් සංසිද්ධීන්, ජීවිතානුභූතීන් තුළින් හමන මානව භක්තිය කැටිවුණු සුවඳ, අප සිත් පුබුදු කරවන්නේද ජනිත කරවන්නේ ද ජනකවියෙක් තම නිර්ව්‍යාජ කවියකින් අප සිත් සතන් පුබුදු කරවන අයුරිනි. ඔහු විසින් ඔහුගේ ගේය පද සංකල්පනා සඳහා රචනා කරන ලද හෝ, තෝරාගත් නිර්මාණ රැ සකින්ම විශද වන්නේ ජනකවියාගේ කවියෙහි වූ සරල බව හා අව්‍යාජත්වයයි.

**ඔබට තිබෙන ආදරෙ මම කියාල දෙන්න**
**ගසක තියෙන තල් කොල මදි**
**ලියාල දෙන්න**
**ඔබෙ ලස්සන හිනාව**
**මොහොතකට දකින්න**
**කුරුල්ලෙක් වෙලා හිතෙනව**
**ඉගිලී එන්න..**

ජනකවියාගේ මුවින් ගිලිහුණු අව්‍යාජ සිතුවිලි ධාරාව නොවේද එම්.එස්.ගේ ගීතයෙන් ප්‍රතිනිර්මාණය වී ඇත්තේ? ගහක තියෙන තල් කොළ මදි, කුරුල්ලෙක් වෙලා හිතෙනව ඉගිලී එන්න වැනි යෙදුම් නගන ව්‍යංගාර්ථ අපූරුය. භාවිත වචන තුළ සැඟවුණු ව්‍යංගය, වදන්හි වූ ගීතවත් බව, උපමා රූපක, මෙන්ම අනුභූතීන් කෙතරම් දුරට අපගේ ජීවිත හා බැඳුණේද යන කාරණාවයි. වරෙක ඔහු ටැක්සිකාරයා වෙයි. තවත් ගීයක දී මව්බිමෙහි සොබා සිරියෙන් මත් වී එහි සුන්දරත්වය දකියි. ආදරය පිළිබඳ ගී තුළින් විටෙක අම්මා හා පෙම්වතිය පිළිබඳ තරුණ ආකල්ප ප්‍රශ්න කරයි. ඒ පිළිබඳ විචාරශීලී වෙයි.

**සැවැන්දරා සුගන්දයෙන්**
**හිමාලයේ සිසිල් සුවෙන්**
**මගේ හිතයි ගතයි වෙලා**
**සිනා සඳෙන් කැලුම් හෙලා**
**ඔබයි බලන්නේ... ඔබයි බලන්නේ...**
**ඔබයි බලන්නේ... ඔබයි බලන්නේ...**

සුසිල්ගේ සරත්ගේ තාත්තාගේ නම අගට ප්‍රනාන්දු කියලා ආවට එයා හොඳ බෞද්ධයෙක්. හැබැයි අන් හැම ආගමකට ගරු කළා. එයා ගල්කිස්ස ප්‍රදේශයේ හිත හොඳ චණ්ඩියෙක්. ඒ කාලේ චණ්ඩි කියන්නේ සමාජ අසාධාරණයට එරෙහිව නැගී සිටින මිනිසුන්ට. තාත්තා හොඳට කරාටේ ක්‍රීඩාව ප්‍රගුණ කරලා තිබුණා. ඒ දවස්වල ලංකාවේ බයිලා කලාවේ රජා වුණේ වොලී බැස්ටියන්. මට මතකයි මම කුඩා කාලේ බයිලා තරග සංවිධානය කරනවා. විවිධ කලා සංගම් විසින් බයිලා තරග පවත්වනවා. ඒ කාලේ ඒ හැම තරගයකින්ම ජය ගන්නේ එම්. එස්. ප්‍රනාන්දු. ඒ කියන්නේ මගේ තාත්තා. ජයග්‍රහණය කරපුදාට පහුවෙනිදා අපේ ගෙදර ලොකු පාර්ටි එකක් තියනවා. හැම කලාකරුවෙක්ම වාගේ අපේ ගෙදරට එනවා. එදාට ඉතින් මුළු ගල්කිස්ස පළාතම බයිලා සාගරයක ගිලෙනවා. සුසිල් අයියා ලොකු හුස්මක් පිට කරයි. සරත් අයියා ශාන්ත අයියා අම්මාට ලංවෙයි.

**මුතු මැණික් ආදරේ නොවේ**
**මිල මුදල් ආදරේ නොවේ**
**ආදරේ එතරම් ලාභ නොවේ**
**ඔයා දන්නේ නෑ**

ගර්ටි, ඩල්සි, කොන්සි සහ වෝල්ටර් යන පවුල් යාන්ත්‍රණයේ වරෙක පියකු ද වරෙක සහෝදරයකු වුයේද සියලූ බර කරට ගත්තේ එම්. එස්.ය. ඇල්බින් අයියා, වින්ටාරේ, ඔලි අයියා, පියසේන අයියා,ඉබා අයියා, එම්.එස්. අයියාගේ වටේ සිටි අයියලාය.

ඒ 1994 බක් මාසයයි. පෙරදින ප්‍රසංග රාශියකට සහභාගි වූ ඔහු කොළඹ හැටේ

34 වන පිටට